# ගොයම් කවි ශතකය හෙවත් අභිනව ගොයම් මාලය....

අවබාගේ උඩගම 'පුලස්ති' හි පදිංචි

**ජේ. එච්. එම්. මාරසිංහ මහතා විසින්**

රචිත කවි 100 කින් යුත් මෙම කාව්‍ය සංග්‍රහයේ පළමු කවි පංතිය ගිය වර කලාපයේ පළ විය, ඉදිරි කලාප වලදී අනික් කවි කොටස් වශයෙන් පළවනු ඇත.

## වී වගී

අකුරම්බා - අඟුරැලි සහ අකුරම්බඩ ඇල්
ඇත්දෙවරැද්දිරි - ඇදඇල් සහ ඉදිපත් ඇල්
ඉලංකාලි - ඉලං ගමටටන් - ඌරා ඇල්
කළුවීපොලී - කරඇල් - කරගල් - කවුඩුලු ඇල්

කහඇල් - කහටම්බා - කළුපොත්ඇල් - කලු ඇල්
කළුකර ඇල් - කලුකුන්දන් - කළුකුණ්ඩා ඇල්
කලුකොතවිය - කලුකොස්ඇට - කලුවීරලු ඇල්
කලුහීනැටි - කිරිකුණ්ඩා - කිරිකුරුම්බ ඇල්

කිරිනාරන් - කිරිබරුඇල් - කුඳුඇල් කුරු වී
කුරුමා - කුරුවීපත් ඇල් - කිරිකුරු මා වී
කුරුලුතුඩුද - කුරුලු ඇල්ද - කළුමුරුංග වී
කොත්ඇල් - කොටටියාරන්ද - කොත්තමල්ලි වී

කොඳු ඇල්-කොහු-කොහු දෙවැරැද්දිරි-කොහු මා වී
ගිනිමා - ගීනිකුඩඇල් - කොහු හොතරවාළු වී
ගම්බොඩහීනැටි - ගල්බඩඇල් - ගිරේස වී
ගොඩමා - ගොඩහොනරවාලු - තලමල් ඇල් වී

තවුඇල් - තවුපත් ඇල් - තණඇල් – තුලුංග වී
දෙවරැද්දිරි - දේවරාජඇල් - දෝ ඇල් වී
නාරන් ඇල් - නුගපත් ඇල් - පතුපන්නැටි වී
පතණ්කාලි - පුස්සයම්බ - නාරන් ඇල් වී

පොඩිරටවී - පොඩිහාතලි - පොඩිහීනැටි වී
බටුකිරිඇල් - බරපොත්ඇල් - බරුඇල් - බරු වී
රත්කුන්ඩන් - බලල්වාන - මඩකිරි ඇල් වී
මඩතවාලු - මඩහීනැටී - මලමරියන් වී

මහාකරලිනා - මහකළු - මහකළුදුරු වී
වහකිරියල් - මහනාරන් - මාඇල් - මී වී
මාදෙළුවා - මාපත්ඇල් - මීපත් ඇල් වී
මුත්නැස - මුතුකිරිඇල් - මුතුසම්බා - මොනර වී

රතුහාතලි - රතුවීපත් ඇල් - වතුමා වී
රාවණඇල් - වතුඇල් - සුදුඇල් - වතුමා වී
සුදුකුමාර - සුදුකොස්ඇට - සුදු පත්නැටි වී
සුදු මානික්කන් - සුදුමුත්තැස් - පොඩි ඇල් වී

සුවන්දිරන් - හත්පිත්ඇල් - සුදුහීනැටි වී
සුවඳැල් - සුදුමුරුංගාද - සුලයි - සම්බා වී
සුදුහාතලි - හැවද - හුනු - හොනරවාළු වී
හැලිසුදුඇල් - හිගුල්පත්ද - කුරු - කුරුමා වී

## පැලපත ආරක්ෂා විධි

මෙසේ නොයෙක් නම ඇති වී වපුරා කෙත් වල
රැකුම බැලුම කොට පඳුරුද ගැසී වැඩෙන කල
යොවුන් සුරුපි අඟනන් සැදී පෙලින් පෙල
නෙලන්ට බැස්සෝ සුරඟන විලසින් කෙත් වල

මිහිරි හඬින් කිඳුරඟනන් පරදන තාලෙට
කියන කලට කන්කලුගී දන්මන පොබ කොට
සිතට - ගතට - සැපත - සතුට නිම්නැත ගොවි යට
මසට - දෙකට ගොයමද ලොකුවී පීදෙන විට

රන ගිරා - ගොයම්කුරුලු-ලේන-කොබෙ යියෝ
මානබලා එත් කුඹුරට හාවොද මීයෝ
ඔන තරම කැවත් සිත සතුටින් ගොවියෝ
පේන ලෙසට පඹයින් - වකපෝරු සදයියෝ

රන්වන් කරලින් බැබලි පැසෙන ගොයමට
එන්න - ගන්න - ගොවිමහතුනි දැකැති සූරතට
වන්නම - සිවුපද - කියමින් බසිමු ලියද්දට
රුදගත කුන්දම් - තාලෙට කපමු ගොයම් මිට

පැසී ගොයම් රන්වන් පාටින් බැබලෙන විට
බසී තරුණ ගොවිකැල දැකැති ගෙන සූරතට
වඩී කරන ගී ගයමින් නැමී - නැගී සිට
නිසි ලෙස කපන් බුළුමැඩී හා බෙර තාලෙට

මිටින් මිටට කපන ගොයම් පරිස්සමින් ගෙන
තබන්න වම් ඇලයෙන් උප්පිඩී සැදෙන මෙන
එහෙන් මෙහෙන් ඉගිලෙන කොරවක්කන් බලමින
කියන්න කවි බෙරතාලෙට මහන්සි දුරු වෙන

කැපූ ගොයම එක් කරනට එන අඟනන් නේ
හිනා හඬත් වළලු හඬත් එකට ගැමෙන් මෙන්
කෙතට අරක්ගත් දෙවියොත් ඉන් තුටුවත් නේ
මිහිකත සැනසේ ගොවියාට කිරි ඉතිරෙන් නේ

## II ගොයම් යාගය

සව්සත ඉපැදු මට
මැව් වෙ පොළව හැම විට
ජීවිකය රක්ම ට
අහර මුල්වේ සියලු සත් හට

ලෝ සතුන් හැම වම
මිනිසා වෙය උත් තම
ඔහුගේ අහර සැම
වැඩෙන්නේ මේ පොළෝ තලෙහිම

නැණින් අග තැන් පත්
මිනිසා සොබා දහ මත්
පස් මහ බූත යොත්
තමන් සිත්සේ වැඩට යොද වත්

පෙර මහ විය ත්තෝ
දෝසත සඳ ගත්තෝ
එයින් පළ ගත්තෝ
කියමි ගොවිකම් විදි දිමු ත්තෝ

---

නුඹලාට සැබැවක් කියමි. ස්වාමි වරුන් දෙදෙනෙකුට සේවය කරන්නට කිසිවකුටත් නොහැක. මක්නිසාද? ඔහු එක් කෙනෙකුට වෛර කරමින් අනෙක් තැනැත්තාට ප්‍රිය වන්නේය. හෙවත් එක් කෙනෙකුට ඇලුම් කරමින් අනෙකා හෙළා දකින්නේය. දෙවියන් වහන්සේටද - වස්තුවටද සේවය කරන්නට ඔබට නුපුළුවන."

— යේසු ස්වාමි දරුවන්ගේ කන්ද උඩ දේශනාවෙන් —